# හාදුව

ජයන්ත නිමල් සිරි



හඳුනගත් ගොඩක් කලකට පස්සෙ
තනි කමක් ළඟදී අපි
තනිවෙච්ච වෙලාවක
ඔබට දුන්...
ඔබෙන් මා වෙත ලැබුන...

වෙන් නොවූවද
කල්ප කාලෙකට,
දුරස් වෙන මොහොතකදී
මතක් වෙන්නට තිබුන...

ඒ අලුත් දවස් වල
ගෙයින් පිටවන මොහොතෙ
තකහනියෙ දුව ඇවිත්
තියා ගන්නට දුන්න...

අහිංසක පැටියන්ගෙ
ඇස්වලට වැලි ගසා
නොකැමැත්තෙ - කැමැත්තට
කැමැත්තෙන් ඉඩ දුන්න...

කනප්පුව මත
තේ පිරිසිය ඇල්මැරුණ
හොයයි උණුහුම,
ටික කලක සිට මග හැරුණ...

ලද මහන්සිය හිතකට නොගෙන,
පිරිමදින - බත් බඳින
රෙදි දොවන - හති අරින..
පිටව ගොස් සියල්ලන්
විත් ඉදිරි දොර වසන...

හීනෙකින් වත් මොකොට
නොමනාප -
ඒ දවස් වියපතට සින්න වුන...

www.boondi.lk




## පුංචිම දොස්තර

පුංචිමදොස්තර
ප්ලාස්ටික් නලාවෙන් ලෙඩ බලන,
බලා මාහද ගැස්ම
විසල්කර නිල් දෑස
හදමඬල බඳ යැ'රඑ'ඉ'එල මොරගාන
හපා ගෙන පුංචිතොල
සුවවීම පිණිස මට
බෙහෙත් තුණ්ඩු ද ලියන
පුංචිම දොස්තර
හදවතක් නොමැති මම
ඔබේ සිනාඹ සුවකින් පණ ලබන

මලිති විජේසේකර

# නිරිඳ ඔබ ම මිස

මාලතී කල්පනා ඇම්බ්‍රෝස්

මඬසිත් එඬදළ රළ පතර
නොහිමි සෙනෙහස් මුතු අහුර
ගෙන හොවා හද ගැඹර
සිඹින, මුදුවට...නළලත

මල් කෙමි වතළ තුරු අස
සඳ මිණි දුලන අතු අග
සරන වෙරළත
සුපෙම්බර මඳ නළ
නිරිඳ ඔබ ම මිස *අන් කවරෙද

සිතඬග රළ රැළි ලන
කින්නර නාද රඬතර
සකෂෙවි පෙමැඬදුරු
වැළඳ ගත් දිවි තෙර

සකිසඳ....,
ඔබ සයුර..මා එහි දියඹ...

www.boondi.lk

# සොහොන්පල්ලාගේ රාත්‍රිය

කපිල එම්. ගමගේ

සොහොන් කොත් අතර මැද
සෙමෙන් පියවර තබමි
මළවුන්ට රිදෙන්න
සිතක් ඇතියැයි සිතමි

නන්නාඳුනන උනුන්
එකම සමබිම හිඳින
මහ පොළොව සයන කොට
එකට තුරුළුව නිදන

සිව් රියන් පස් යටින්
ආදරේ මුල් දුවන
කවුරුවත් නෑ ඉතින්
එයට බාධා කරන

ඉඳහිටක අර අතන
නමක් නැති ගසක් මත
ආදරේ සඟවගත්
සුදු පාට මල් පිපෙන

පිපි පරවෙන කලට
සොහොන් කොත් මත වැතිර
මුදු සිතින් පෙති සලා
මිහිදන් වෙන්න පතන

සඳ එළිය ඇති රෑට
කවුරුවත් නැති කලට
පෙම්වතුන් ඔවුනොවුන්
සෙමින් මුමුණනු අසන

දිවා කල නෙලාගත්
පිච්ච මල් මිටක් ගෙන
මම මගේ ආදරය
වැළලූ තැනක් සොයන

හැමදාම මේ වගේ
සඳ නොමැති රෑ කලට
සොහොන් කොතඬකුදු නොමැති
තැනක එය ඇස ගැසෙන

කාලාන්තරයක්ම
සොයමින් තැනින් තැන
මෙය නොවෙද ඒ පෙම
ළදරු වයසින් මැරුණ

පිච්ච මල් මිට තබා
මොහොතක් බලා හිඳින
කරුණ කිම මේ විලස
එමල් රතු පැහැ ගැනෙන...

# රැයිත හත

ඉන්දික ගුණවර්ධන

සැබැවි
මම රැයිත හත

කුලයෙන් ද
බලයෙන් ද
නිළයෙන් ද
අන්තෙටම පිරිහුණ
කිසිවෙකුත් නොසලකන
මමයි ඒ
පාච්චල් රැයිත හත

වංශවත් යැයි කියන
රජවරු ද
රජ බලෙන් තෙද පාන
බිසවුන් ද
උන්ට ආවැඬදූමෙන් බලය ගත්
බූරු මැති ඇමතින් ද
තුට්ටුවට නොසලකන
නෝන්ජල් කොළය මම
සැබවි
මම රැයිත හත

තඹේකට නොකර මායිම් නිතොර
ඔච්චමට හිනැහෙන්න
දකින දකිනා විටම
කපා පාගා දමා පරදන්න
සහමුලින් වනසන්න
එහෙත් මට හැකිය තව ඉවසන්න
සැබවි
මම රැයිත හත

නමුත් කොළ වෙනස් වනු ඇත දිනක
රැයිතයට පවා බලතල ලැබෙන
රාජ වංශය පවා දන නමන
බිසෝවරු ඇමතියන් හිස නමන
නෝන්ජල් යැයි කියා සිනාසුණු
රැයිත හතකින් පවා ගෙළ සිඤෙන

එතෙක් මා පෙළා ඔබ වැජඹෙන්න
මට හැකිය තව කලක්
ඔහේ ඉවසා ඉන්න

www.boondi.lk

# ලංකාවේ නිර්භයාගේ දුක්බර අවසානය

**නිර්භයා** යනු ඉන්දියාවේදී බස් රථයකදී බලහත්කාරයෙන් දූෂණය කොට මරා දැමූ තරුණියකි. ඇගේ මරණය නිසා මුළු ඉන්දියාවේ යුක්තිය සමාජ සාධාරණත්වය අගයන ජනයා වීදි බැස දූෂකයන්ට එරෙහිව නිතිය ක්‍රියාත්මක කරන ලෙසට පාලකයන්ට බල කළහ. ඒ නිසා දැන් නිර්භයා දූෂණය කොට මරා දැමූ දූෂකයන් පෝරකය හමුවේ සිටිති. නමුත් ලංකාවේ දිනකට කාන්තාවන් පස් දෙනකුවත් අවම වශයෙන් දූෂණය

***<u>මෙය රෝගී වූ නිර්වින්ධිත සමාජයකි. එවැනි සමාජයක දේශපාලන බලයක් ඇති සාරුවා යනු වීරයෙකි.</u>***

වෙති. එහෙත් මුළු සමාජයම නිහඬය.

එක්සත් ජනතා නිදහස් සංධානයේ අකුරැස්ස ප්‍රාදේශීය සභා සභාපති සාරුව ලියනගේ සුනිල් විසින් බාල වයස්කාර දැරිවියක් විසින් දූෂණය කරන ලදී. ඒ ඔහුගේ 200 වන බිල්ල සැමරීමටය. මෙම දැරියගේ මව 2004 සුනාමියෙන් මිය ගොස් ඇත. දැරිය ජිවත් වුයේ දරිද්‍රතාවය මැද ය. ඒ නිසා ඇය පහසුවෙන් සරුවා ඇතුළු ඔහුගේ පාදඩ සගයන්ට ගොදුරු වුවාය. සාරුවා රිමාන්ඩ් භාරයේ සිටින විටද බත් පැකට් එකට සහ අරක්කු බාගෙට එලියට බැස්ස ඔහුගේ



ආධාරකරුවන් සරුවා නිදහස් කරන ලෙස උද්ගෝෂණය කළහ. ඒ උද්ඝෝෂකයන් අතර කාන්තාවන්ද සිටි අතර ස්ත්‍රී දූෂණය ගැන ලංකාවේ පවතින පසුගාමී ආකල්ප ද ඉන් නිරූපනය විය.

මෙම උද්ඝෝෂණ සිද්ධි වලින් පසුව දියණියගේ පියා තම ජීවිත ආරක්ෂාව පතා ප්‍රදේශයෙන් පලා යාමට සිදු විය. මෙසේ විවිධාකාරයේ පීඩන වලට මුහුණ දුන් සරුව විසින් බිලිගත් ලාබාල දැරිය පසුගිය දෙසැම්බර් මාසයේ වස පානය කිරීමෙන් දිවි නසාගෙන තිබේ. මේ නිසා ස්ත්‍රී දූෂක සාරුවාට නීතියේ හිඩැස් අතරින් ගැලවී යාමට දැන් ඉඩකඩ සැලසී තිබේ. නමුත් මේ අපරාධය සහ අසාධාරණයට එරෙහිව ලංකාවේ සමාජය තුලින් බලවත් හඬක් නැගෙන්නේ නැත. මෙය රෝගී වූ නිර්වින්ධිත සමාජයකි. එවැනි සමාජයක දේශපාලන බලයක් ඇති සාරුවා යනු වීරයෙකි. ලංකාවේ මිනිසුන් නිර්භයා වෙනුවෙන් පෙනී සිටින්නේ නැත , ඔවුන් බොහෝ දෙනෙකු සාරුවා වෙනුවෙන් පෙනී සිටිති.

මෙම සංසිද්ධිය අතීතයේ ද අප දැක තිබේ. ලාබාල දැරියක් දූෂණය කල දුමින්ද සිල්වාට නීතියෙන් ගැලවී යාමට ඉඩ ලැබුනා පමණක් නොව ඔහුට ඡන්දය දීමටද ලංකාවේ මිනිසුන් පෝලිමේ ගියහ. මිනුවන්ගොඩ ප්‍රියදර්ශනී දූෂණය කල මුද්දරගම ජයසිංහ නොහොත් කුකුල් චාලි අද ලංකාවේ රාජ්‍ය ආයතනයක කොමසාරිස් ය.

දේශපාලන බලය හිමි සරුවා විසින් තලා දැමූ මල් කැකුල පිළිබඳව නන්දා මාලිනී ලා ගීත ගයන්නේ නැත , සුනිල් ආරියරත්නලා ගීත ලියන්නේ නැත. ඇය ගැන හෙළයේ මහා කලාකරුවන් වන සෝමරත්න දිසානායක, ජැක්සන් ඇන්තනි ලා සමාජය අවධි කිරීමට ශෝක නිර්මාණ කරන්නේ නැත. අවම වශයෙන් බොරුවට කාන්තා අයිතීන් ගැන කිඹුල් කඳුළු සලන කාන්තා සංවිධාන වත් පෙරට එන්නේ නැත. එවැනි දේශයක ලංකාවේ නිර්භයාගේ දුක්බර අවසානය ගැන කථා කිරීමට කිසිවෙකු නැත. ඇය ළමා වියේදීම සමාජ අසාධාරණයන්ට ලක්ව මිළිනව ගියාය.

http://www.lankaguardian.com/2013/02/blog-post_1447.html